**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2018**

---

**තත්ත්වාගණනය කළ මතය**

රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.4 මූල්‍ය ප්‍රකාශන

### 1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදි ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.4.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව ගිණුම් සැකසීම උපචිත පදනම මත සිදු කරන අතර අතිකාල අරමුදලින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු සියයට 10 වටිනාකම ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ මුදල් පදනම මත පෙන්වා තිබීම හේතුවෙන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වටිනාකම රු.5,808,889 ක් අඩුවෙන් දක්වා තිබුණි. | යම් වර්ෂයකට අදාළ මුළු අතිකාල ලැබීම්වලින් සියයට 10 ක් මුදල් පදනම මත මාසිකව රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකරනු ලබන අතර එය ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදය අනුව සිදු කරනු ලබයි. ඒ අනුව යම් වර්ෂයකට අදාළ රජයේ ඒකාබද්ධ අරමුදලින් බැර කරනු ලැබූ මුළු මුදල් ප්‍රමාණය ආදායම් ප්‍රකාශනය තුළ පෙන්වනු ලබයි. වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන සියයට 10 ක ප්‍රමාණය ගණනය කිරීමේ දී ඒවන විට උපලබ්ධි වී ඇති මුදල් ප්‍රමාණය අනුව ගණනය කිරීම වඩා සුදුසු බව නිරීක්ෂණය කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම් සැකසීමේදී උපචිත පදනම පමණක් භාවිතා කළ යුතු බව. |

### 1.4.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂය තෙක් අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිශතය සියයට 15 ක අගයක් වූ අතර ප්‍රවර්තන වර්ෂයේ එම ප්‍රතිශතය සියයට 5 දක්වා අඩුකර තිබුණද, ණයගැතියන්ගේ පැවැත්ම හා ආයුකාලය සැලකිල්ලට ගැනීමකින් තොරව පොදු රේටයක් නියම කර තිබුණි. ඉකුත් වර්ෂවලදී යොදා ගත් පදනම මත අඩමාන ණය වෙන් කිරීම සිදු කලේ නම් සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය රු.38,170,534 ක් විය යුතු වුවද, ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම නිසා එය රු.12,723,511 ක් දක්වා අඩුවී තිබුණි. තවද, ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම නිසා සමාලෝචිත වර්ෂයට අදාලව මෙම විෂයය යටතේ වියදමක් පැනනැගී නොතිබූ අතර අඩමාන ණය අධිවෙන්කිරීමක් ලෙස රු.16,672,894 ක් විස්තීරණ ආදායම් හා වියදම් ප්‍රකාශනයේ අතිරික්තයට එකතුකර තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය තුළ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාල ශේෂයන් ඇතුලත්ව ඇත. එයින් 2014-2017 කාලයට අයත් රු.145,595,100 න් රු.142,366,500 ක් හෙවත් සියයට 96 ක් පමණ අයවීමට තිබුණේ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් *ගුවන්* සමාගමෙනි. මෙම ණයගැති ශේෂයට අදාළ හිඟ අතිකාල මුදල්වලට අදාළ බිල්පත් එම ගුවන් සමාගම වෙත යොමු කොට ඇති අතර අදාළ අතිකාල බිල්පත් පරීක්ෂා කිරීමෙන් පසු අදාළ අතිකාල මුදල් ගෙවීමට එම ගුවන් සමාගම එකඟ වී ඇත. (2014 හා 2016 වර්ෂයන්ට අදාළව අයවීමට ඇති හිඟ අතිකාල මුදල් මේ වනවිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇත.) එමෙන්ම 2018 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ප්‍රමාණය වූ රු.254,470,228 න් රු.108,875,128 ක් හෙවත් සියයට 43 ක් පමණ 2018 වර්ෂයට අදාළ වේ. මෙම මුදල් 2019 වර්ෂය තුළ පියවනු ඇත. මෙම තත්ත්වය තුළ ණයගැති ශේෂය තුළ නියෝජනය වන වටිනාකමෙන් ණය අයකර ගැනීමට ඇති අවදානම අඩුවී ඇති බැවින් අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රතිශතය සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. එබැවින් අවසාන මූල්‍ය ප්‍රකාශනයේ 21 වන පිටුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සටහනේ දක්වා ඇති පරිදි 2017 වර්ෂයේ සියයට 15 ක්ව පැවති අඩමාන ණය ප්‍රතිශතය 2018 වර්ෂය තුළ දී සියයට 5 දක්වා අඩු කරන ලදී. | ණයගැතියන්ගේ පැවැත්ම හා ආයු කාලය සැලකිල්ලට ගෙන ඊට අනුව රේටයන් තීරණය කර අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කළ යුතු බව. |

## 1.5 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.2,750,000 ක් වටිනා බැඳුම්කර හා ඊට අදාල ආයෝජන ආදායම ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්වල පෙන්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් නාවික කටයුතුවලට අදාළව නැවේ දේශීය නියෝජිතයා හෝ නැව අයත් සමාගමේ දේශීය නියෝජිතයාගෙන් රු.100,000 ක තැන්පත් මුදලක් ලබා ගනී. මෙසේ ලබා ගන්නා තැන්පත් මුදල්, මහා භාණ්ඩාගරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 18/128 දරන තැන්පත් ගිණුම යටතේ ගිණුම් ගත කරනු ලබයි. එමෙන්ම මෙසේ ලබා ගන්නා මුදල් එදිනම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් ජාලය යටතේ රේගු අධ්‍යක්ෂ ජනරාල් නමින් පවත්වාගෙන යන මහජන බැංකුවේ අංක 00110129026664 දරන ගිණුමට බැර වේ.ඒ අනුව මෙම ගිණුම යටතේ ඒකරාශි වන මුදල් මහා භාණ්ඩාගාරයේ බැංකු අයිරාව සඳහා ගෙවන පොලිය අවම කර ගැනීමට පහසුකමක් සලසයි.<br>කරුණු එසේ වුවද උක්ත ගැසට් නිවේදනය පරිදි මෙහි සඳහන් රු.100,000 ක තැන්පතුව සඳහා පොලී ඉපයීමක් කර එයින් රජයට අදාළ කොටස රඳවාගෙන ඉතිරි මුදල තැන්පත්කරු වෙත ආපසු ගෙවිය යුතුය. මේ ආකාරයට කටයුතු කළහොත් මහා භාණ්ඩාගාරයට ඉහත ජේදයේ විස්තර කර ඇති පරිදි බැංකු අයිරා පොලිය අවම කර ගැනීමට ඇති හැකියාව නැති වී යයි. එමෙන්ම අයිරා පොලිය තැන්පතු සඳහා ලැබෙන පොලියට වඩා සෑම අවස්ථාවකම වැඩි නිසා මෙම වැඩපිළිවෙල ආර්ථිකමය වශයෙන් රජයට අවාසි සහගත බැවින් අදාල ගැසට් නිවේදනයේ I කොටසෙහි I ජේදයේ අනු අංක 6 යටතේ සඳහන් විස්තරයෙහි අවසාන ජේළි දෙක සංශෝධනය කිරීම සුදුසු බවට අවධානය යොමුකර ඇත. | බැඳුම්කර වටිනාකම සහ ඊට අදාල පොලිය විධිමත් පරිදි ගිණුමෙහි ඇතුළත් කළ යුතු බව. |

**1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) පොදු තැන්පතු | 349,140 | තැන්පත් ලෙජරය | විගණන නිරීක්ෂණය නිවැරදිය. රු.349,140 ක මුදල ඉතා දිගු කලක් තිස්සේ හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නිරාකරණය නොවූ වගකීමක් ලෙස අතිකාල අරමුදල් ශේෂ පත්‍රය තුළ දක්වා ඇත. එබැවින් මේ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට 2019 මැයි 06 දින ලිපියක් යවා ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදී. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර කඩිනමින් අවසන් තීරණයකට එළඹිය යුතු බව. |
| (ආ) ණයගැතියෝ | 254,470,228 | ශේෂ සනාථ කිරීම් | පිළිතුරු එවා තිබූ සියලුම ණයගැතියන් සඳහා ඔබට ද පිටපතක් සහිතව ශේෂ සනාථ කර එවන ලෙස අංක OTC/15 හා 2019 ජනවාරි 28 දිනැති ලිපිය මගින් දන්වා ඇත. නමුත් එම ලිපි සඳහා ආයතන කිහිපයකින් පමණක් පිළිතුරු ලැබුණු අතර එහි පිටපතක් මේ සමග ඔබගේ දැනගැනීම සඳහා අමුණා එවමි. | ශේෂයන් සනාථ කර විගණකාධිපතිවරයා වෙත සෘජුව ප්‍රතිචාර දැක්විය යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට ආයතන 81 කින් අයවිය යුතුව පැවති එකතුව රු.මිලියන 254 ක් වූ ණයගැති ශේෂයෙන් සියයට 73 ක් එනම් රු.මිලියන 186 ක් ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමෙන් අරමුදලට අයවිය යුතුව පැවති අතර මෙම හිඟ ණය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ හිඟ අතිකාල මුදල වන රු.මිලියන186 න් රු.මිලියන 29.9 ක් 2019 වර්ෂයේ පළමු කාර්තුව තුළ අයකරගෙන ඇති අතර අයවීමට ඇති ඉතිරි මුදල් 2015 වර්ෂයේ සිට අයවිය යුතු ශේෂයන් වේ. මීට අදාළ සියලුම අතිකාල බිල්පත් එම ගුවන් සමාගම වෙත යවා ඇති අතර එම අතිකාල බිල්පත් ද හැකි ඉක්මනින් පියවීමට එම ගුවන් සමාගම එකඟ වී ඇත. | මෙම සමාගම යාවජීව සාමාජිකයෙකු බැවින් අදාල ශේෂය කඩිනමින් අය කර ගත යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ආයතන 75 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු.253,314ක මුදල බාහිර ආයෝජනවල යෙදවීම තුලින් උපයා ඇති මුදල රු.මිලියන 12.5 ක් විය. මේ අනුව සමස්ථ ආයෝජනය රු.මිලියන 12.8 ක් වූ මෙම ආයතනවල පැවැත්ම මෙන්ම වර්තමානයේදී සේවා සැපයීම පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල තැන්පතු වගකීම් සහ ආයෝජන ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | රු.මිලියන 12.5 ක ආයෝජන වටිනාකමට අදාළ ආයෝජන ආදායම, ආයෝජන ගිණුම හර කර විශේෂ තැන්පතු ගිණුමට බැර කර ඇත. | වර්තමානයේදී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳ විමර්ශනය කර නිසි ගිණුම් තැබීමක් සිදු කිරීම හෝ අවශ්‍ය වෙනත් කටයුතු සිදු කළ යුතු බව. |

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රේගු ආඥා පනතේ 103 වගන්තිය/ 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය/ 2002 දෙසැම්බර් 31 දිනැති අංක 2018 (F) දරන අභ්‍යන්තර චක්‍රලේඛය | • සහකාර නිවාරණ නිලධාරී (වරාය රාජකාරී) විසින් බහාළුම් මෙහෙයුම් පිළිබඳ දත්ත දෛනිකව ගණකාධිකාරී (අතිකාල) වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ ඉටු කර නොතිබුණි.<br>• අතිකාල ලැබීම් හිඟහිටීම් වලකා ගැනීම සඳහා බිල්පත් යාවත්කාලීනව නිකුත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි . | • සහකාර නිවාරණ නිලධාරී (වරාය රාජකාරී) මගින් දෛනිකව රැස්කරන අතිකාල වාර්තා දෛනිකව ගණකාධිකාරී (අතිකාල) වෙත යැවීම හා ආකෘතිපත්‍ර 06 හා IMO FAL ඇතුළු අනෙකුත් නැව් ලේඛන දෛනිකව රේගුවේ වරාය පාලන ඒකකය (Port Control Unit) වෙත යැවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අණපනත් සහ චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |
| | • නෞකා නියෝජිතයන්ගේ තොරතුරු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දත්ත සමඟ පරීක්ෂා කර තහවුරු වාර්තාවක් ප්‍රධාන නිවාරණ නිලධාරී විසින් ගණකාධිකාරී වෙත ලබාදී නොතිබුණි . | • නෞකා නියෝජිත ආයතන වලින් අයවීමට ඇති අතිකාල පිළිබඳව අතිකාල ලෙජරයේ අදාළ අයදුම්පත් අංකය යටතේ දක්වා ඇත. එසේ අයවීමට ඇති මුදල් වාර්ෂිකව ගණන් බලා ඊළඟ වසරේදී ඔවුන්ගේ බැඳුම්කරය අලුත් කිරීමට ප්‍රථම අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව නෞකා නියෝජිත ආයතනවලින් 2018 | අණපනත් සහ චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති මුදල්, මූල්‍ය ප්‍රකාශනවල අය විය යුතු ණය ශේෂ ලෙස ණයගැතියෝ යටතේ දක්වා ඇත. එම මුදලින් මේ වනවිට සියයට 30 ක් පමණ අයකරගෙන ඇත. | |
| | • බහාළුම් මෙහෙයුම් තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකය විසින් සිදු කරනු ලැබුවද ඒ සඳහා නීත්‍යානුකූල කාර්ය පැවරීමක් හෝ තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොපැවතීම . | • 2019 අප්‍රේල් 01 දිනැති අංක DOPL 218F දරන දෙපාර්තමේන්තු නියෝගය අනුව රේගුවේ වරාය පාලන ඒකකයට (Port Control Unit) නැව් වරාය වෙත පැමිණීම හා ඒ සම්බන්ධ වාර්තා පවත්වාගෙන යාමටත්, අතිකාල වාර්තා හා වරාය බහාළුම් අංගන මඟින් ලබාදෙන වාර්තා පරීක්ෂා කර ගෙවිය යුතු නියමිත අතිකාල ප්‍රමාණය ගණනය කිරීමටත් සහ රේගුවේ මූල්‍ය අංශය වෙත එම තොරතුරු ඉදිරිපත් කිරීමේ වගකීමත් පවරා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | අභ්‍යන්තර චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානය යොමු කර තත්ත්වය විධිමත් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| | • නෞකා නියෝජිත ආයතනවලින් ලබාගන්නා රු.100,000 ක් වූ තැන්පතු සුදුසු ආයෝජන මාර්ගයක ආයෝජනය කර පොලී ආදායමින් රජයට අයවිය යුතු කොටස හඳුනාගෙන ඉතිරිය තැන්පත්කරුට ගෙවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | • අදාළ ගැසට් නිවේදනයේ අවශ්‍ය සංශෝධනයන් සිදු කිරීමට ඇති හැකියාව සොයා බලමින් පවතී. | අභ්‍යන්තර චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |
| (ආ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 2017/3 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා අතිකාල ලෙස ගෙවා තිබූ මුදල රු.මිලියන 651.8 කි. | විගණන නිරීක්ෂණය කෙරෙහි පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී ද සාකච්ඡා කළ නමුත් ඒ සඳහා අවසන් තීරණයකට එළඹීමට නොහැකි විය. | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරීන්ට අදාල පොදු චක්‍රලේඛ අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අතිකාල අරමුදල තුල ආයෝජන ලෙස රු.මිලියන 13 ක මුදලක් සහ භාණ්ඩාගාර අරමුදල ලෙස රු.මිලියන 2,179 ක මුදලක් දීර්ඝ කාලයක සිට සමුච්චිත වෙමින් පැවතියද, විධිවිධාන ප්‍රකාරව අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රය ප්‍රකාර රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාජකාරි වේලාවෙන් බැහැරව ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අය කරනු ලබන සියලුම මුදල් තැන්පත් ගිණුම් අංක 6000-0-0-6-32 දරන රේගු අතිකාල , නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල් ගිණුමට බැර කර ඇති අතර මෙහි පරිපාලන බලධාරියා වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්ය. වාර්ෂිකව අතිකාල ලෙස එකතු වන ලැබීම්වලින් සියයට 10 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඉතිරි සියයට 90 ක මුදල් ප්‍රමාණය රේගු නිලධාරීන් සඳහා ගෙවනු ලබයි. තව ද ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදය අනුව අතිකාල ලෙස එකතුවන ගාස්තුවලින් සියයට 10 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඉතිරිය නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා ගැනීමට ඉඩ දිය හැක. මේ ආකාරයට කටයුතු කිරීම තුළ වඩා හොඳ සේවක තෘප්තියක් ඇතිවීම මගින් ඔවුන්ගේ වැඩිපුර සේවය වෙනුවෙන් කැපවීම නිසා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වැඩි වීමට හේතු වේ. එමෙන්ම මෙම අරමුදලේ පවතින්නේ ඒකාබද්ධ අරමුදලට සියයට 10 ක් බැර කළ පසු ඉතිරි වී පවතින මුදල් නිසා 2016 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 ප්‍රකාරව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොගනී. | අදාල චක්‍රලේඛයට අනුව සමුච්චිත වෙමින් පවතින අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සම්බන්ධව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගැනීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 334,904,166 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 320,188,374 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,715,792 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---------------------------------------------------------------------

රේගු ආඥාපනතේ 103 වගන්තිය අනුව නිකුත් කරන ලද 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී වේලාවන්වලින් පරිබාහිර වේලාවන්වලදී කරනු ලබන රාජකාරී වෙනුවෙන් සහ සාමාන්‍ය රාජකාරි ස්ථානවලින් පරිබාහිර ස්ථානවලදී ඉටුකරනු ලබන රාජකාරී සඳහා ඊට අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු හා අයකිරීම්ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට තාක්ෂණික සේවා සැපයීම වෙනුවෙන් එම ආයතනයෙන් අයකරනු ලබන ගාස්තුද අරමුදලට බැර කළයුතු වේ. එසේම, එම අතිරේක රාජකාරී වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් මෙම අරමුදලේ වැය බරක් සේ සලකනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් පරිදි අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.1,071,405,674 ක්, රු.335,848,526 ක් හා රු.13,728,000 ක් රැස්කර තිබූ අතර එම වැඩ කටයුතුවල නිරත වූ නිලධාරීන්ට පිළිවෙලින් අතිකාල ආදායමෙන් සියයට 61 ක් ලෙස රු.651,843,884 ක්, නැව් බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් ලෙස රු.167,924,263 ක් හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.10,982,400 ක් ගෙවා තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

-------------------------

පෙර වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 5.15 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එම අනුපාතය 6.08 ක් විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 0.93 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එයට ප්‍රධාන හේතුව ලෙස ණයගැතියන්ගේ වර්ධනය හා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයන්ගේ වර්ධනය බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නිලධාරීන් දිනපතා අඛණ්ඩව පැය 24 ක් පුරා සේවයේ යෙදවීම ඉතාම අසාමාන්‍ය තත්ත්වයක් වුවද රේගු දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් වර්ෂය පුරා අඛණ්ඩව දිනකට පැය 24 බැගින් සේවයේ යෙද වූ බවට, වාර්තා කර අතිකාල ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. සති අන්ත දිනවලදී සමහර ශාඛාවල යතුර හෝ භාර නොගෙන තිබියදී අතිකාල ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් සිදු කල නියැදි පරීක්ෂාවේදී එවැනි දින 628 ක් සඳහා රු.849,638 ක මුදලක් අතිකල දීමනා ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් රේගු ආඥා පනතේ 103 වගන්තියේ විධිවිධාන, මේ දක්වා නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග සහ අතිකාල කමිටුවේ නිර්දේශ මත ක්‍රියාකර ඇත. කෙසේවුවද, අතිකාල ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත. | අතිකාල ගෙවීමේදී අධීක්ෂණ නිලධාරීන්ගේ දැඩි අධීක්ෂණයක් සිදු විය යුතු බව. |
| අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛන්ඩව පෙන්වා දී තිබුණ ද තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වාත් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි . විදේශ පුහුණු පාඨමාලා සඳහා විදේශ ගතව සිටි නිලධාරීන් තිදෙනෙකු සඳහා ද දින 18 ක් සඳහා අතිකාල වශයෙන් රු.8,333ක් ගෙවීම් සිදු කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් රේගු ආඥා පනතේ 103 වගන්තියේ විධිවිධාන, මේ දක්වා නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග සහ අතිකාල කමිටුවේ නිර්දේශ මත ක්‍රියාකර ඇත. කෙසේවුවද, අතිකාල ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත. | මේ පිළිබඳව පවත්නා නීතිරීති අනුව විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු බව. |
| අතිකාල ගෙවීම් සඳහා නියමිත අනුමැතීන් ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොවීම හා අතිකාල සේවයේ යෙදවීම ,ලේඛන පවත්වා ගැනීම ,අධීක්ෂණය හා ගෙවීම් කිරීම විධිමත්ව සිදු නොවීම. | රේගු දෙපාර්තමේන්තුව තුළ අතිකාල ගෙවීම් නැවත සමාලෝචනය කර අතිකාල ගෙවීමේ නව ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු වී ඇත.<br>එමෙන්ම විගණන විමසුමේ සඳහන් විදේශ පුහුණු වැඩසටහන් (රාජකාරි) සඳහා සහභාගී වී ඇති නිලධාරීන් විදේශ ගත කාල සීමාවන් තුළ අතිකාල සේවයේ | අතිකාල ගෙවීමේදී අධීක්ෂණ නිලධාරීන්ගේ දැඩි අධීක්ෂණයක් සිදු විය යුතු බව. |

| | | |
|---|---|---|
| | යෙදී ඇති බවට අදාළ අතිකාල අත්සන් ලේඛන එවා තිබූ අධ්‍යක්ෂවරුන්ගෙන් මේවනවිට කරුණු විමසා ඇති අතර විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන්ගෙන් එම කාලසීමාවන් සඳහා ගෙවා ඇති අතිකාල දීමනා වහාම ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. | |
| (ආ) සේවක පැමිණීම හා පිටවීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම. | 2.1(ආ) හි පිළිතුර අදාළ වේ. | ඇඟිලි සළකුණු යන්ත්‍ර හඳුන්වා දීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) විගණන විමසුම්වලින් පිළිගත් අඩුපාඩු සකසා ගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණයක් නොවීම. | මේ දක්වා ලැබී ඇති විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු බොහෝ දුරට සකස් කරගෙන ඇති අතර ඉදිරියේ දී තවදුරටත් ඒ සම්බන්ධව සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් කිරීමට සටහන් කර ගතිමි. | නිසි අධීක්ෂණයක් කළ යුතු වීම. |
| (ඈ) අතිකාල ලේඛන දිනපතා අධීක්ෂණ නිලධාරියෙකු විසින් අධීක්ෂණය කර පියවා දැමීමට කටයුතු කර නොතිබීම. | ඉහත (අ) පිළිතුර අදාල වේ. | නිසි අධීක්ෂණයක් කළ යුතු වීම. |
| (ඉ) අතිකාල සම්බන්ධ ආසන්න රේගු චක්‍රලේඛ කෙරෙහි (DOPL) අවධානය යොමු වී නොතිබුණි. | අතිකාල සම්බන්ධව මේ දක්වා නිකුත් කර ඇති දෙපාර්තමේන්තු චක්‍රලේඛ පරිදි කටයුතු කර ඇත. | අභ්‍යන්තර චක්‍රලේඛ කෙරෙහි දැඩි අවදානයක් යොමු කළ යුතු බව. |